නමෝ බුද්ධාය

දාහ නව වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05

මාසික ධර්ම සංග්‍රහය අංක: 181

ශ්‍රී. බු. ව. 2559 | 2015 ජූලි 01 | ඇසළ කලාපය

# සාමය රජයන සමාජයකට මඟ

ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහානායක, සාහිත්‍ය චක්‍රවර්තී,
භාෂා විශාරද, සාහිත්‍ය ශූරී, ෂට්භාෂා පරමේශ්වර, මහෝපාධ්‍යාය,
ශ්‍රී සුමංගල විද්‍යායතනංස, ග්‍රන්ථ විශාරද රාජකීය පණ්ඩිත

**අතිපූජ්‍ය දවුල්දෙණ ඤාණිස්සර මහා නා හිමිපාණන් වහන්සේ විසිනි**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///

**ජයං වේරං පසවති - දුක්ඛං සේති පරාජිතෝ**
**උපසන්තෝ සුඛං සේති - හිත්වා ජය පරාජයං**

(ධම්මපදය-සුඛ වග්ගය)

සැදැහැවත් පින්වතුනි,

අද ධර්ම දේශනාව සඳහා මා තෝරා ගත්තේ "සාමය රජයන සමාජයකට මඟ" යන මාතෘකාව යි. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරනු ලැබූ ධර්මය කරුණු සංක්ෂිප්තව ඉදිරිපත් කරන ධම්ම පදයේ සුඛ වග්ගයට අයත් වන පස්වැනි ගාථාවයි.

කෝසල රාජ්‍ය පාලනය කළ කොසොල් මහරජතුමාට අවශ්‍ය වුනා මගධ රාජ්‍යයත් තමන්ගේ පාලනයට නතුකර ගැනීමට. මේ සඳහා කීපවතාවක් ම යුද වැදී උත්සාහ කළත් එම බලාපොරොත්තුව සාර්ථක වුයේ නැහැ. එම අවස්ථාවේදී කොසොල් රජ්ජුරුවෝ සාලකිරීමට පත්වෙලා "මට වඩා බාලයකු වූ අජාසත් රජු සමග යුද්ධ කරලා පරාජය වීමෙන් මම නිගාවට පත්වුනා. එය බලගතු රජ කෙනෙකු

හැටියට මට සුදුසු නැතැයි සිතමින් ඉතාම කනස්සල්ලෙන් , දොම්නසින් ආහාරපාන පවා ප්‍රතික්ෂේප කරමින් නිදාගෙන සිටින බව දැනගත් භික්ෂූන් වහන්සේ බුදුරජාණන් වහන්සේට මේ කාරණය ගැන දැනුම් දුන්නා. මේ තොරතුරු ඇසූ බුදුරජාණන් වහන්සේ,

ජයං වේරං පසවති - දුක්ඛං සේති පරාජිතෝ
උපසන්තෝ සුඛං සේති - හිත්වා ජය පරාජයං

යන ගාථාවෙන් කොසොල් රජතුමා මුල් කරගෙන ධර්ම දේශනා කළා.

ජයග්‍රහණය කරන්නා පරාජිත පුද්ගලයා තුළ වෛරය ඇති කරවන බවත්, පරාජිතයා එයින් දුකට පත්වන බවත්, සන්සුන් පුද්ගලයා දිනුම් පැරදුම් හැර සුවසේ වෙසෙන බවත් එම ගාථාවේ සරල අදහසයි.

වර්තමාන ලෝකය පුරාම අපට දකින්නට ලැබෙන්නේ මිනිසා ආශාවෙන් පසුපස හඹා යමින් මනුෂ්‍ය කමටත් නොගැලපෙන, තරඟකාරී ජීවන රටාවකට හැඩගැසෙමින් සිටින බවයි. බල තණ්හාවෙන්, ධන තණ්හාවෙන් සහ නිල තණ්හාවෙන් හිස උදුම්මවා ගත් මිනිසා සෑම මොහොතකම අනුන් අභිබවා තමා පමණක් ඉස්මතු වීමට යත්න දරමින් සිටිනවා. බහ තේරෙන වයසේ සිටින කුඩා දරුවාගේ පටක් මරණ මංසද්වකයේ සිටින වැඩිමහල්ලා දක්වා සමාජයේ ජීවත් වෙන නොයෙකුත් තරාතිරම් වල පුද්ගලයන් මෙම විනාශකාරී තරඟයට මුහුණ දී සිටිනවා. යමකට තරඟ කරන උදවිය ජය හෝ පරාජය හෝ විඳ දරා ගැනීමට සූදානමින් සිටිය යුතු වුවද අද සමාජයේ එබඳු සාමකාමී පුද්ගලයින් විරලය.

යුද්ධ කිරීම, කලහ කෝලාහල කිරීම, සූදු කෙළීම වැනි අනුවණ ක්‍රියාවන්ට මිනිසා පෙළඹෙන්නේ ජයග්‍රහණ පතාගෙන වුවත්, ඉන් එක් අයෙකු හෝ පිරිසක් හෝ පරාජය වීම අනිවාර්යයෙන් ම සිදුවන්නකි. දශක කීපයක සිට ශ්‍රී ලාංකීය සමාජය තුළද ආත්මාර්ථකාමීත්වය හා බලකාමය ඉස්මතුවී රට කරවන දේශපාලන අධිකාරියට සමගාමීව ජන ජීවිතය තුළද ප්‍රබල ගැටලු සහගත තත්ත්වයන් හිස ඔසවා ඇති බව අපි හොඳින් දන්නා කාරණයක්. මෙම සියලු කාරණා වලට මුල්වී ඇත්තේ අත්තුක්කංසනය හා පරවම්භනයයි. ජාතීන් වශයෙන්, කුල මල වශයෙන්, තම තමන්ගේ ඕනෑ එපාකම් අදූරදර්ශී ලෙස සන්තර්පනය කර ගැනීමට යාමෙන්

මිනිසා විසින් ම මිනිසා විනාශ කිරීමේ ප්‍රචණ්ඩකාරී අරගලයකට මැදිහත්ව සිටී. අතීතයේ අපේ මුතුන් මිත්තන් ඉතා සාමකාමීව රටේ දියුණුව සඳහා කැපවූයේ පරාර්ථකාමීත්වය තම ජීවිතයට ආභරණයක් කර ගනිමින්. ඒ සඳහා ධර්මයට අනුකූලව ධර්මානු ධර්ම ප්‍රතිපත්තියක පිහිටා ක්‍රියා කිරීමෙන් ලෝකයෙන් උතුම් රට ලෙස විරුදාවලී ලබන්නට තරම් පෙහොසත් වුනා. මිනිස් ජීවිත රැක ගැනීමට පමණක් නොව සතා සිවුපාවාගේ පවා ජීවිතවල සුරක්ෂිතතාව, තහවුරු කිරීමට කටයුතු කළා.

අධිරාජ්‍ය වාදීන් විසින් අපේ හෙළ දරුවන් අමු අමුවේ මරා දමද්දීත් එදෙස උපේක්ෂාවෙන් යුතුව බලා සිටින්නට තරම් අපේ මිනිසුන්ට හැකි වුයේ ධර්මය තුළ ජීවත් වෙමින් ධර්මය තම ජීවිතයට බද්ධ කරගත් නිසා ම යි. වී ගොවිතැනින් දිවි ගෙවූ අපේ පැරණි ගොවීන් තම කුඹුරේ ලියද්දක් සතුන් සඳහා වෙන් කර තැබීමට තරම් කාරුණික වුයේ ඔවුන් තුළසැබෑ මිනිස් ගති පැවැති නිසාමය.

එසේ දැහැමිව හැඩගැසී තිබු අපේ සමාජය අද වන විට එකිනෙකා පරයා නැගී සිටීමට වෙර දරන මිනිස්කම නොහඳුනන ම්ලේච්ඡත්වයෙන් හා දීනත්වයෙන් පිරි අදැහැමි දිවයිනක් බවට පරිවර්තනය වෙමින් තිබෙනවා. ඒ අවාසනාවන්ත තත්වයෙන් අපේ මිනිසුන් ගලවා ගැනීම සඳහා වහවහා පිළියම් යෙදිය යුතුව ඇත.

ගමත්, සිද්ධස්ථානයත් අතර ඇති සම්බන්ධතාව දුරස්වන්නට දුරස්වන්නට මේ තත්වය වඩ වඩාත් දරුණු විය. එයින් සිදුවන්නේ මුළු මහත් ජාතියේම පිරිහීමයි. එසේ නම් විවිධ අන්දමින් භේදභින්න වී එකිනෙකා මරා ගනිමින් සිදු කෙරෙන මෙම නිරර්ථක ක්‍රියාවන්හි අර්ථ විරහිත බව අවබෝධ කරවීමෙන් සාමය රජයන සමාජයක් ගොඩනගා ගත හැකිය.

බුදු දහමින් නිර්දිෂ්ට ධර්මානුකූල ප්‍රතිපත්ති අතරින් පංචශීල ප්‍රතිපත්තිය පමණක් වුවද මේ සඳහා ප්‍රමාණවත් වනු ඇත. නොයෙකුත් අපරාධ දූෂණ මිනීමැරුම් ආදිය දිනෙන් දින ඉහළ යමින් අසංවිධිත සමාජ ක්‍රමයක් ඇති වෙමින් පවතින්නේ එකිනෙකා ගේ බල පුළුවන්කාරකම් කුරිරු ලෙස ප්‍රදර්ශනය කිරීමට යොමු වීම නිසාවෙනි. පංචශීල ප්‍රතිපත්තියේ පිහිටා ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලය අනුව "මම වැරදි නොකරමි අනුන් ලවාද වැරදි නොකරවමි. වැරදි කිරීමට අනුන්ට අනුබල නොදෙමි."

යන නොවැදෑරුම් ශික්ෂණය මිනිස් සිත් සතන් තුළ දැඩි ලෙස කාවැද්දීමට අපි උත්සුක විය යුතු වෙමු. සුළු දෙයකට වුවද ඉතා දරුනු ලෙස කිපී බද්ධ වෛරයක් බවට පත්කර ගැනීමෙන් සමාජයට සිදුවන බරපතල විනාශය පිළිබඳ දැනුවත් කරමින් හිංසනය පිටු දැක අවිහිංසක සමාජ වාතාවරණයක් ඇති කරගත යුතුව තිබෙනවා.

කෙනෙකුන් පරදවා ජය ලබන්නා නිතරම උද්දාමයට පත්ව අභිමානයෙන් සමාජයේ කැපී පෙනීමට උත්සාහ කරනවා. එයින් සිදු වන්නේ තමාට විරුද්ධ වෛර කරන්නෙක් ඇතිකර ගැනීමයි. එම වෛර කරන්නා නිරතුරුවම සතුරා පිටු දකින්නේ කවදාදැයි සිතමින් කාලය ගෙවනවා. දිනුම පැරදුම අතහැර දැහැමි ජීවිතයක් හුරුකරගන්නා පුද්ගලයා සෑම මොහොතකම සන්සුන් මනසකින් කටයුතු කොට තම ජීවිතය සාර්ථක කර ගැනීමට වෙහෙසෙනවා. එය ජය පැරදුමට වඩා වැදගත් බැවින් ධර්මානුකූල ජීවිතයකට ඔබද හැඩ ගැසීමට යුහුසුළු විය යුතුය.

**සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා.**

**ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !**